


# දියවන්නා සටන

අද මුහුණට මුහුණ සංවාදය සඳහා එක්වන්නේ ජාතික ජන බලවේගයේ මාතර දිස්ත්‍රික් අපේක්ෂක නීතිඥ ජයන්ත පතිරණ සහ සර්ව ජන බලය පක්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක තාරානාත් බස්නායක යන අයයි.

# මුහුණට මුහුණ



## කකුල් මාට්ටුවලින් අපිව වට්ටන්න බෑ

ජාතික ජන බලවේගයේ මාතර දිස්ත්‍රික් අපේක්ෂක **නීතිඥ ජයන්ත පතිරණ**

**● පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරකම් හා මුලින්ම සම්බන්ධ වෙන්නේ කොහොමද? කොයි කාලෙ ද ?**

මං 1971 අවුරුද්දේ, ඉස්කෝලෙ යන කාලෙ තමා මුලින්ම පක්ෂයට එකතු වෙන්නෙ. ඊට පස්සෙ පේරාදෙණිය කැම්පස් එකට ගියාම සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ආරම්භක සිසුන් 4 දෙනාගෙන් කෙනෙක්. එතැන හිටියේ ශාන්ත බණ්ඩාර, මම,ලලිත් සේනාරත්න සහ ඒ කාලෙ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වෙච්චි චන්ද්‍රපාල. ඒ අයගෙන් තාම ලංකාවේ දේශපාලනය කරන්නෙ මං විතරයි.

**● පාසල් ශිෂ්‍යයකු හැටියට දේශපාලන ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමේ අත්දැකීම කොහොමද? ඔබට ඒ පිළිබඳ අවබෝධයක් තිබුණ ද?**

ඇත්තම කියනවා නම් කිසිම දේශපාලන අවබෝධයකින් සම්බන්ධ වුණා නෙවෙයි. ඒ කාලයේ යෞවන වයසේ හැමදේම ගැන කුතුහලය තියෙනවනෙ. ඉතිං, තියෙන දේශපාලන ක්‍රමයට වඩා වෙනස්, රැඩිකල් එකක් නිසා ඒකට ආසාවක් ඇතිවෙලා පස්සෙන් ගියා. ලොකු අවබෝධයක් තිබුණ නෙවෙයි. ඒත් විශ්වවිද්‍යාලයේදී සම්බන්ධ වෙන්නෙ නම් යම් දැනුම් තේරුම් ඇතිව, කරන කියන දේ ගැන වගකීමක් ඇතිව.

**● 71දී පාසල් සිසුවකු වුණත්, 88-89 කාලය වෙද්දී ඔබ යම් පරිණත ක්‍රියාධරයෙක් විය යුතුයි. ඒ කාලෙ මොන වගේ අත්දැකීම්වලට ද මුහුණදුන්නේ?**

1983 දී පක්ෂය තහනම් කළාට පසුව මගෙන් සක්‍රිය දේශපාලන ක්‍රියාකාරකම් අඩුවුණා. හැබැයි පක්ෂයේ සහෝදරවරුන්ට උදව් කළා. සම්බන්ධකම් දිගටම තිබුණා. 88 වෙද්දි මං හිටියෙ අම්පාරෙ. ඒ කාලයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙලා හිටියෙ අකුරැස්සෙ මුණසිංහ කියලා සහෝදරයෙක්. එයාව පසුව එයා මරාදාලා ඊටපස්සෙ 89 දී තමා නැවත මාතරට ආවේ. ඒ කාලෙ මං දිස්ත්‍රික් කෝපරේෂන් එකේ ගාල්ලෙ කළමනාකාර හැටියට තමා වැඩ කළේ.ඉතාම දරුණු මර්දන කාලයේ. 90 ජනවාරි 06 වැනිදා පාන්දර 1ට 2ට විතර පොලිසිය මගේ ගේ වට කළා. ඔෆ් කම්බයින් එකක් එක්ක ඇවිත්. ඒ ඇත්තටම මගේ සබෑ ක්‍රියාකාරකම් දැනගෙන නෙවෙයි. පක්ෂයේ නායක මට්ටමේ සහෝදරවරුන් ඇවිත් විටෙන්විට මේ ගෙදර නවාතැන් ගන්නවා කියන ආරංචියට තමයි ආවෙ. එදා හවස මාව තලල්ල කඳවුරට අරන් ගියා. හමුදාවේ නුගේරා කියල සැරපරුෂ මනුස්සයෙක් තමා එතැන හිටියේ. හැබැයි ඊට පහුවෙනිදා මාව එව්වා.

මං පස්සේ දැනගත්තු හැටියට එහෙම එවන්නට හේතුවෙලා තිබුණේ හිටපු මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහත්තයා. එයා මාව දැනගෙන හිටියෙ විශ්වවිද්‍යාලයේ දේශපාලනය කරද්දි. හැබැයි මට වඩා සීනියර් කෙනෙක්. මේ වෙද්දි එයා මාතර සහකාර මැතිවරණ කොමසාරිස්. මං අරන් ගිය බව ආරංචි වුණු ගමන් එයා ගිහින් බ්‍රිගේඩියර් සී.වී. පීරිස් මහත්තයා හම්බවෙලා තියෙනවා. ඒ උපදෙස් අනුව තමා නුගේරා මාව නිදහස් කරන්නට ඇත්තෙ. කඳවුරේ ගතකෙරුවේ එක රාත්‍රියක් වුණත්, මට කවදාවත් අමතකනොවන සිදුවීමක් එදා වුණා.

**● ඒ මොකක්ද?**

එදා රෑ මගේ ඇස්දෙක ඉස්සරහ ඒ වෙද්දි අත්අඩංගුවේ හිටපු අපේ සහෝදරයකුට වෙඩි තියලා මැරුවා. එදා තලල්ල කඳවුරේ රැල්ෆ් නුගේරා, පස්සෙ කාලෙක විශේෂ බළකායේ මේජර් ජෙනරල් වුණා. ඒත් මේ කෲර මනුස්සයා පහුවදා මාව බලන්න, බිරිය සහ දරුවන් ආවම, දූගෙ ඇස්වලත් කඳුළු දැකලා මිනිහටත් ඇඬුණා. "දුවේ ඔයා අඬන්න එපා මං ඔයාගෙ තාත්තා එක්කරගෙන යන්න දෙන්නම්" කියලා දුවව එයාගෙ උකුළෙ තියාගත්තා. මං දැක්කා මේ අර මගේ ඇස් ඉදිරි පිටම මිනී මරපු නපුරු මිනිහාගෙ ඇස්වලත් කඳුළු. කොහොම වුණත් මාව ගෙදර යැව්වම මං ගෙදර හිටියෙ නෑ. අපි ඉක්මනින්ම ගාල්ලෙන් ගෙයක් අරන් එහේ පදිංචියට ගියා. ඒත් පක්ෂයට උදව් කළා දිගටම.

**● නැවත ප්‍රසිද්ධ දේශපාලනයට එන්නෙ කොයි කාලෙ ද?**

2002 දී විතර එළියට ඇවිත් ක්‍රියාකාරීව සම්බන්ධ වෙන්න කියලා පක්ෂයෙන් ආරාධනාවක් ආවා. ඒ වෙද්දි මං නීතිඥයෙක්. එහෙම නමක් තියෙන කෙනෙක් ප්‍රසිද්ධියේ වැඩ කරන එක පක්ෂයට හොඳයි කියලා ඒ ආව සහෝදරවරුන් මට කීවා. ඒ අනුව ගෙදර අය විරුද්ධ වෙද්දී 2002 පළාත් පාලන ඡන්දෙට ඉදිරිපත් වුණා. මාතර මහනගර සභාවේ පළවැනි ජවිපෙ මන්ත්‍රී මමයි. ඊළඟ මැතිවරණයෙන් පක්ෂයෙන් වෙනත් කෙනෙක් දැම්මා. ඒත් ඉතා කෙටි කාලයකින් නැවතත් මට එන්න කීවා. අවුරුදු 8ක් විතර එතැන ඉඳලා, පළාත් සභා ගියා. රස්සාවයි ගෙදර දොර ප්‍රශ්නයි එක්ක පූර්ණකාලීනව වැඩ කරන්න අමාරුයි කියලා කීවත්, පක්ෂයේ සහෝදරවරුන් මට පළාත් සභාවට ඉල්ලන්න කීවා. ඒ නිසා පළාත් සභා ඉල්ලලා, දිනවලා 2019 අවසන් වන තෙක් හිටියා. ඒ විදිහට නගර සභාවේ දෙපාරක් හිටියා. පළාත් සභාවේ දෙපාරක් හිටියා.

**● ඔබ නීතිඥයකු ලෙසත්, පක්ෂයේ හිතෛෂිවන්තයන්ටත්, තවත් බොහෝ දෙනෙකුටත් නොමිලේ නීතිමය සහය සඳහා මැදිහත් වෙන කෙනෙක් විදිහටත් ප්‍රසිද්ධයි?**

ඔව්. නීතිඥයකු ලෙස කටයුතු කරන්න පටන් ගත්ත දා සිටම මෙහෙ උසාවියේ දිගටම විශ්වවිද්‍යාල සිසුන් වෙනුවෙන් පෙනී සිටියේ මමයි. ඒ වෙනුවෙන් මං ඒ ළමයින්ගෙන් සත පහක්වත් අරන් නෑ. සමහර ළමයි විශ්වවිද්‍යාලයෙන් අයින් වෙලා ගිහින් රස්සාවක් කරන කාලෙ ඇවිත් හම්බ වෙලා තෑගි බෝග, මොනවහරි දීමනාවක් දීලා ගිය අවස්ථා තියෙනවා. ඒත් ළමයින්ට සල්ලි නෑනෙ. ඉතිං ඒ අය ඉගෙන ගන්න කාලෙ මොන ප්‍රශ්නයක් වුණත්, මං සල්ලි සත පහක්වත් ගන්නෙ නැතිව තමා පෙනී ඉන්නෙ. වෘත්තීය සමිතිවල නඩුත් එහෙමයි. අරගල කාලෙත් අරගලකරුවන් වෙනුවෙන් සියලු නඩුවලට නොමිලේ පෙනී හිටියා. ලංකා පත්තරේ අපේ මාධ්‍යවේදීන් වාර්තාකරණයට ගිහින් එයාලට වැටුණු නඩුවටත් මං නොමිලේම කතා කළා. එහෙම සහය වුණු අවස්ථා ගොඩක් තියෙනවා.

**● මේ ආණ්ඩුව ඉතා කෙටි කාලයකින් කඩා වැටෙයි කියලා සමහරු කියනවා. ඒ පිළිබඳ ඔබේ අදහස මොකක්ද?**

ජාතික ජන බලවේගය බලයට පත්වුණොත් ඩොලර් එක 400ට යයි, ගෑස් පෝලිම් එයි, තෙල් පෝලිම් එයි, විදේශ ආයෝජන නැති වෙයි, රට ලේ විලක් වෙයි, ඔය වගේ කතා ගොඩක් කීවනෙ. ඒ මොනවත් වුණේ නෑනෙ. වෙන්නෙත් නෑ. විදේශ සම්බන්ධතා ශක්තිමත් වෙලා, ආයෝජන වැඩිවුණා. නතර කරලා තිබුණු ජපන් ව්‍යාපෘති 11ම ආයෙ ආරම්භ කළා. මේ වැඩේට එකඟ වෙලා මිනිස්සු ගොඩක් වෙනස් වෙලා. මං අද පාතේගම රැස්වීමකට ගියා. එතැන පැරණි ජවිපෙ සාමාජිකයෙක් හිටියෙ එක්කෙනයි. අනිත් ඔක්කොම පොහොට්ටුවේ සහ යූඇන්පී. ඉතිං ඒ වගේ ජනාධිපතිවරණයේදී පවා අපිව සැක කළ බොහෝ දෙනෙක් මේ මහමැතිවරණයෙදී අපට ඡන්දය දෙනවා. ඒ නිසා අපට ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන්.

**● කුමන්ත්‍රණ කරන එක නතර වෙන එකක් නෑ ?**

කවුරු කකුලෙන් ඇද්දත් මේ ගමන යන්න අපට පුළුවන්. අපි ක්‍රියාත්මක කරන්නේ ජනතාවාදී වැඩපිළිවෙළක්. ජනතා ද්‍රෝහී කිසිවක් කරන්නෙ නෑ. එහෙම වුණාම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පවා ජනතාවාදී අණපනත්වලට, අපේ වැඩපිළිවෙළට විරුද්ධ වෙලා ගමට යන්න විදිහක් නෑ. ඒ නිසා ඡන්දෙ කාලෙට මොනව කීවත් මහමැතිවරණයෙන් පස්සෙ අපට විරුද්ධව ජනතා ද්‍රෝහී වෙලා වැඩකරන්න, විපක්ෂයේ අවස්ථාවාදී පක්ෂවල නියෝජිතයන්ටත් හැකියාවක් නෑ.

> ජාතික ජන බලවේගය බලයට පත්වුණොත් ඩොලර් එක 400ට යයි, ගෑස් පෝලිම් එයි, තෙල් පෝලිම් එයි, විදේශ ආයෝජන නැති වෙයි, රට ලේ විලක් වෙයි, ඔය වගේ කතා ගොඩක් කීවනෙ. ඒ මොනවත් වුණේ නෑනෙ. වෙන්නෙත් නෑ. විදේශ සම්බන්ධතා ශක්තිමත් වෙලා, ආයෝජන වැඩිවුණා. නතර කරලා තිබුණු ජපන් ව්‍යාපෘති 11ම ආයෙ ආරම්භ කළා.

**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**



## ආණ්ඩුව එපා, විපක්ෂය අපට දෙන්න

සර්ව ජන බලය පක්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක **තාරානාත් බස්නායක**

**● මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට පරණ මුහුණු අලුත් පක්ෂවල මුවාවෙන් නැවත දේශපාලන කරළියට එමින් සිටින බවට ඇතැමුන් චෝදනා කරනවා. ඔබත් එවැන්නෙක් ද?**

පසු ගිය සමයේ ලංකාවේ දේශපාලනය තුළ ජනහදවත් දිනාගත් ප්‍රධාන පක්ෂවල යම් යම් ව්‍යාකූලත්වයන් නිර්මණය වුණා. ඒවා බොහොමයක් අභ්‍යන්තර ප්‍රශ්න වුණාට එම පක්ෂවල සිටියේ මෙරට පුරවැසියන් මහත් ඕනෑකමින් සිය සර්ව ජන ඡන්ද බලය පාවිච්චි කර පාර්ලිමේන්තුවට යවන ලද ජනතා නියෝජිතයින්ම යි. නමුත් පක්ෂ ඇතුළත ඇති වුණු ව්‍යාකූල ස්වභාවයන් සහ ඇතැම් මහජන නියෝජිතයින් පිළිබඳව ජනතා විශ්වාසය පලුදු වීමත් සමඟ ලංකා දේශපාලනයේ විශාල පෙරළියක් සිදු වුණා. ඒ අනුවයි අලුත් ගමනක්, අලුත් දේශපාලන න්‍යාය පත්‍රයක් සහිත පක්ෂ කරළියට ආවේ. තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති සහ එම අලුතින් මතු වුණු දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති අතර ගැටීමක් නැති නම් එකිනෙකට සමපාත නොවෙනවා නම් අලුත් පක්ෂ වටා පෙළ ගැසීම වරදක් නොවෙයි. ජනතාව ප්‍රතික්ෂේප කරන තැනක ඉන්නවට ජනතාව පිළිගන්නා පක්ෂයක් එක්ක වැඩ කිරීමට බාධාවක් නෑ.

**● වමේ කඳවුර බිඳ වැටීම නිසා අලුත් පක්ෂ කරළියට ආ බවද ඔබ කියන්නේ?**

ඇත්තෙන්ම ඔව්. ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ දැවැන්ත ක්‍රියාදාමයක් ඉටු කළ වාමාංශික දේශපාලනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා තමයි ප්‍රමුඛව කඳවුරු බැඳගෙන තිබුණේ. මේ පක්ෂයට ජනතාව බොහොම ආදරය කළා. නමුත් මේ පක්ෂ අද කැඩිලා විසිරිලා ගිහින් පුද්ගල බද්ධ වන ආකාරයට විවිධ කණ්ඩායම් බිහිවෙලා. දරුණු අර්බුද සහ මතවාදි ගැටුම් නිසයි මේ තත්ත්වය උදා වුණේ. එම වාමාංශික පක්ෂවල අනාගතය අද ප්‍රශ්නකාරියි.

**● සර්ව ජන බලය පක්ෂයේ නායකත්වය විසින් හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය කාරණාවලට ඔබට එකඟ විය හැකි නිසාද ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ අතහැරියේ?**

සර්ව ජන බලය පක්ෂයේ නිර්මාතෘ දිලිත් ජයවීර මහතාගේ ව්‍යවසායකත්ව රාජ්‍යයක් බිහි කිරීමේ සංකල්පය අපි බොහොම ඉහළින් පිළිගන්නවා. අද ශ්‍රී ලංකාව තුළ හිඩැසක් නිර්මාණය වෙලා තිබෙන්නේත් ව්‍යවසායකත්වයට ප්‍රමුඛස්ථානයක් නොදුන් නිසයි. අධ්‍යාපනය, සෞඛ්‍යය යන සියලු පැති ඔසවා තැබිය හැක්කේ ආර්ථිකය ශක්තිමත් වුණොත්. ව්‍යවසායකත්වය ශක්තිමත් කළොත් තමයි ආර්ථිකය නැඟි සිටින්නේ. මේ දැක්මට අපි එකඟයි. අන්න ඒ නිසයි එම පක්ෂයෙන් මැතිවරණ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන ලෙස මට ලැබුණු ආරාධනාව පිළිගත්තේ. එම පක්ෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික් නායකත්වය ද මට ලැබුණා.

**● ආණ්ඩු බලය දක්වා සටන් කිරීම ද ඔබේ පක්ෂයේ ඉලක්කය?**

නෑ. අපිට මේ වෙලාවේ ආණ්ඩුවක් පිහිටුවීමට වුවමනාවක් නෑ. අනෙක සර්වජන බලය පක්ෂය ජනතාව අතරට යමින් තිබෙන අලුත් එකක්. අපේ මූලික අභිමතාර්ථය පක්ෂය ශක්තිමත් කරමින් ප්‍රබල විපක්ෂයක් හැදීමයි. අද ජනතාව පක්ෂ දේශපාලනය ප්‍රතික්ෂේප කරනවා. ඔවුන්ට අවශ්‍ය වී තිබෙන්නේ ජනතා විශ්වාසය රැකගත් නායකයින් පාර්ලිමේන්තුව තුළ දැකීමයි. ඒකට ආණ්ඩුවේ ද විපක්ෂයේ ද කියන එක අදාළ නෑ. ජනතාවට අවංකව සේවය කිරීමයි කළ යුත්තේ. මේ ගමන් මඟ ලංකා දේශපාලනයේ අලුත් සංස්කෘතියක් බිහි කරනු ඇති.

**● අලුත් සංස්කෘතියක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?**

අද ලංකාවේ පුරවැසියන්ගේ දේශපාලන දැක්ම හරිහැටි හඳුනාගැනීම සිදු නොවුණු නිසා ප්‍රධාන දේශපාලන පක්ෂ දියාරු වෙමින් තිබෙනවා. වර්තමානයට ගැළපෙන, දියුණු තාක්ෂණයත් එක්ක රට ඉදිරියට ගෙන යන වැඩපිළිවෙළක් වහාම වුවමනා කර තිබෙනවා. 60 දශකයේ පැවති සාම්ප්‍රදායික දේශපාලන සංස්කෘතිය අද ජනතාව අනුමත කරන්නේ නෑ. රට නඟා සිටුවිය හැක්කේ දේශපාලන පක්ෂවල මෙන්ම මහජන නියෝජිතයින් තුළ ද මේ වර්තමානය විසින් ඉල්ලා සිටින අලුත් ප්‍රතිපත්තිමය කාරණා සහ මතවාද තිබෙනවා නම් පමණයි. අද තරුණ පිරිස ලංකාවේ දේශපාලන හැසිරීම පිළිබඳව ඉතා ඕනෑකමින් බලා සිටිනවා. ඔවුන් ගැටුමක් නැතිව බොහොම නිහඬ නමුත් සක්‍රිය ලෙස දේශපාලන තන්ත්‍රයේ ක්‍රියාවලිය ග්‍රහණය කර ගනිමින් ඉන්නවා. අපි ආමන්ත්‍රණය කළ යුත්තේ එම තරුණ සමාජය ඉල්ලා සිටින රාජ්‍යයක් තැනීම සඳහායි.

**● ඉකුත් ජනාධිපතිවරණයේ දී ජයග්‍රහණය ලැබූ ජනාධිපතිවරයාගේ ජාතික ජන බලවේගය පක්ෂය කරළියට ආවේ වෙනසක් කියන සංකල්පය තුළින්. එය ජනතාව අනුමත කළා නේද?**

දේශපාලන ක්‍රියාදාමය තුළ අලුත් දෙයක් සොයන හැමෝම මාලිමාවට ඡන්දය දුන්නේ නෑ. නොදුන් අය අතරත් ඉන්නේ අලුත් දෙයක් බලාපොරොත්තුවන පිරිසක්. ඔවුන් මාලිමාවේ ප්‍රතිපත්තිවලට වඩා ඉදිරියට ගිය වෙනසක් අපේක්ෂා කරනවා. අපි ආමන්ත්‍රණය කරන්නේ ඔවුන්ටයි. ඒ වගේම ජනාධිපතිවරණයේ දී ජාතික ජන බලවේගයට ඡන්දය දුන් අයටත් අපි වටා පෙළ ගැසීමට කිසිදු බාධාවක් නෑ.

**● සර්ව ජන බලය පක්ෂයෙන් මහාමැතිවරණයට ඉදිරිපත් වන අය අතරත් ඉන්නේ අලුත් මුහුණුම ද?**

නෑ. එහෙම එකක් නෑ. අත්දැකීම් බහුල දේශපාලනයේ පෙර නිරත වුණු අයත්ඉදිරියේත් රටට අවශ්‍යයි. ඕනෑ කවුද එපා කවුද කියලා තීරණය කරන්නේ මහ ජනතාවයි. අපි අතර මනාප සටනක් නෑ. සර්ව ජන පක්ෂයෙන් විපක්ෂය ශක්තිමත් කිරීම සඳහා මහජන නියෝජිතයින් වැඩි පිරිසක් පාර්ලිමේන්තුවට යැවීමයි අපේ අරමුණ.

**● ලංකාවේ පාර්මේන්තුව තුළ අපිට මෙතුවක් කල් දක්නට ලැබුණේ සාම්ප්‍රදායික විපක්ෂයක කාර්ය භාරයයි. ආණ්ඩුවේ වැඩවලට කකුලෙන් අදින විපක්ෂය සහ ඔබ අර්ථ දක්වන ප්‍රබල විපක්ෂයක් අතර වෙනසක් තිබෙනවාද?**

ප්‍රබල විපක්ෂයක් කියන්නේ ආණ්ඩුව කරන රටට හිතකර සියලු කටයුතුවලට උපරිම සහයෝගය ලබා දෙමින් ඒ වගේම රටට අහිතකර තීන්දු ගන්නවා නම් ඒ වෙනුවෙන් නොපමාව නැඟී සිටීමයි. ජනාධිපතිවරයාගේ ජාතික ජන බලවේගයට රට හදන ඔවුන්ගේම කියා වැඩපිළිවෙළක් ඇති. අපි ඔවුන්ට කාලයක් දිය යුතුයි. එම කාලය තුළ ඔවුන් රටට කරන්නේ කුමක්ද යන්න බලාගන්න පුළුවන්. ඒ අනුව රටට හිතෛෂි වැඩපිළිවෙළක් නම් අපි බාධා කරන්නේ නෑ.

ජාතික ජන බලවේගය කියන්නේ පාර්ලිමේන්තුවේ සිටි සියල්ලෝම හොරු බවයි .එය ඇත්තක් ද?

ඒ ලේබලයට අයිති අය ඉන්නවා වෙන්නත් පුළුවන්. නමුත් අපි ග්‍රාමීය ජනතාවගේ විශ්වාසය දිනාගෙන දේශපාලනය කළ අය. මගේ පියා බන්දුල බස්නායක මහතාගේ අඩි පාරේ යමින් අපිත් ඒ ජනතා ප්‍රසාදය දිනාගෙන තිබෙනවා. එවැනි චෝදනාවලට අපි ලක් වෙලා නෑ.

> අපිට මේ වෙලාවේ ආණ්ඩුවක් පිහිටුවීමට වුවමනාවක් නෑ. අනෙක සර්වජන බලය පක්ෂය ජනතාව අතරට යමින් තිබෙන අලුත් එකක්. අපේ මූලික අභිමතාර්ථය පක්ෂය ශක්තිමත් කරමින් ප්‍රබල විපක්ෂයක් හැදීමයි. අද ජනතාව පක්ෂ දේශපාලනය ප්‍රතික්ෂේප කරනවා. ඔවුන්ට අවශ්‍ය වී තිබෙන්නේ ජනතා විශ්වාසය රැකගත් නායකයින් පාර්ලිමේන්තුව තුළ දැකීමයි.

**සකුන්තලා ජයසිංහ**